# විශේෂාංගය

## " යුගයේ ගැලවුම්කරු.... "



නාවික හමුදාවේ වීරෝදාර රණවිරුවකු සිය දිවි පරදුවට තබා සිදුකළ වීර ක්‍රියාවකින් අහිංසක ජීවිත රැසක් රුදුරු මරුවාගෙන් බේරා ගැනීමට හැකිවිය.

දිනෙන් දින අත්වන පරාජයන් හමුවේ වියරු වැටී සිටින කුරිරු කොටි ත්‍රස්තවාදීන් දකුණේ අහිංසක සාමාන්‍ය වැසියන් ඝාතනය කිරීම සඳහා බෝම්බ ප්‍රහාර එල්ල කරති.

එසේ පුපුරුවා හැරීමට සූදානම් කර තිබූ කාලබෝම්බයක් අනුරාධපුරය ඉරිදා සති පොළේ තිබී සොයාගෙන නිශ්ක්‍රීය කිරීමට නාවික හමුදාවේ සුළු නිලධාරි (Petty officer) එන්. ඩබ්. එස්. අයි. බණ්ඩාර රණවිරුවා ගත් පියවර නිසා තවත් එල්. ටී. ටී. ඊ. ප්‍රහාරයක් වැළකී ගියේය.

සුළු නිලධාරි නිලය යුද හමුදාවේ සැරයන් නිලයට සමාන නිලයකි. මන්නාරම සිලාවතුර ප්‍රදේශයේ කොන්ඩම්පිඩ්ඩි නාවික හමුදා අනුබණ්ඩයේ ගොඩබිම් ආරක්ෂක රාජකාරියෙහි නිරත නාවික සෙබළකු වන සුළු නිලධාරි බණ්ඩාර සිද්ධිය වන විට නිවාඩු ලබා නිවසට පැමිණ සිට ඇත.

ඉකුත් 10 දා සිය බිරිඳ සමඟ සතිපොළ වෙත ගිය ඔහු සිය බිරිඳගේ බලවත් විරෝධය ද නොතකා අදාළ බෝම්බය නිශ්ක්‍රීය කිරීමට පියවර ගෙන ඇත. මාරක බෝම්බය දුටු මොහොතේ දෙවරක් නොසිතා එය වහාම නිශ්ක්‍රීය කිරීමට ඔහු තීරණය කර ඇත්තේ අහිංසක ජනතාවගේ ජීවිත බේරාගැනීම හමුදා සෙබළකු වශයෙන් තම වගකීම සහ යුතුකම බව සිතමිනි.

ඇත්තෙන්ම එම අවස්ථාව ඔහු රාජකාරියෙන් බැහැරව නිවාඩු ලබා සිටි අවස්ථාවක් විය. ඔහුට එම අවස්ථාවේදී කිසිවක් නොදුටුවා සේ මඟහැර යෑමට වුවද ඉඩ තිබිණි. එහෙත් ඔහුට එම බෝම්බය දුටු විට තම බිරිඳ හෝ දූ දරුවන් ගැන නොව තව නිමේෂයකින් මෙම බෝම්බයට බිලිවෙන අහිංසක ජනතාව ගැන සිහියට නැගී තිබේ.

බිරිඳගේ දැඩි විරෝධය මධ්‍යයේ බණ්ඩාර රණවිරුවා සැනෙකින් ක්‍රියාත්මක වී අසල තිබූ පලතුරු අලෙවිසලකින් කතුරක් ඉල්ලාගෙන කාල බෝම්බයේ පරිපථ කපා අක්‍රීය කර බෝම්බය නිශ්ක්‍රීය කිරීමට සමත්ව තිබේ.

සිය ජීවිතය පරදුවට තබා ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වී සුළු නිලධාරී බණ්ඩාර සිදුකළ එම වීර ක්‍රියාව නිසි ඇගයීමකට ලක්කර ඔහුට උසස්වීමක් ලබාදී ජාතියේ ගෞරව ප්‍රණාමය පුදකිරීමට නාවික හමුදාපති වයිස් අද්මිරාල් වසන්ත කරන්නාගොඩ පියවර ගනු ලැබීය.

ඒ අනුව සුළු නිලධාරි බණ්ඩාර ප්‍රධාන සුළු නිලධාරි නිලයට උසස් කිරීමට නිර්දේශ කර තිබේ. එමෙන්ම තම ජීවිතය පරදුවට තබා අන් ජීවිත බේරාගැනීම එකම අභිලාෂය ලෙස සලකා ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වී ජීවිත රැසක් බේරා ගැනීමට ක්‍රියා කිරීම වෙනුවෙන් වීර වික්‍රමාන්විත පදක්කමක් සඳහා ද ඔහු නිර්දේශ වනු ඇත.

සුළු නිලධාරි බණ්ඩාරට හිමිවීමට නියමිත උසස්වීමට අදාළ නිලය ප්‍රධාන සුළු නිලධාරි නිලයයි. එය යුද හමුදාවේ මාණ්ඩලික සැරයන් නිලයට සමාන වේ.

සුළු නිලධාරි බණ්ඩාර රණවිරුවාගේ වීර ක්‍රියාව සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාවගේ ගෞරවයට සහ ප්‍රණාමයට ලක්වන උදාර ක්‍රියාවකි. ඔහුගේ එම ක්‍රියාව ජීවිත රැසක් බේරාගැනීමට හැකිවීම තුළින් අප ලබාගත් ජයග්‍රහණයක් සේම, සිය අරමුණ ඉටුකර ගැනීමට නොහැකිවීමෙන් කොටි ත්‍රස්තවාදීන් ලැබූ අන්ත පරාජයකි. සිය ඝාතන ඉලක්ක වැරදී යෑමෙන් එල්. ටී. ටී. ඊ. යට එවන් පරාජයන් අත්වෙමින් තිබියදී වන්නි සටන් බිමේදී කොටින්ට අත්වන දැවැන්ත පරාජයන් ද දිනෙන් දින වැඩි වෙමින් පවතී.

හමුදා සේනාංක 05 ක් සටන් පෙරමුණු 04 ක් ඔස්සේ වන්නි කොටි බලකොටු කරා ඇදෙමින් තිබියදී හමුදා ප්‍රහාරවලින් මියයන කොටි ත්‍රස්තවාදීන් සංඛ්‍යාව ද දිනෙන් දින වැඩි වෙමින් පවතින බව හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් උදය නානායක්කාර පවසයි.

ඔහු පවසන පරිදි පසුගිය දින 12 ක කාලය තුළදී කොටි ත්‍රස්තවාදීන් 475 දෙනකු මරුමුවට පත්වී ඇත. මියගිය හමුදා සෙබළුන් ගණන 39 කි.

බ්‍රිගේඩියර් ජගත් ඩයස්ගේ 57 වැනි සේනාංකය වවුනියාව සටන් පෙරමුණ ඔස්සේ ද, බ්‍රිගේඩියර් ශවේන්ද්‍ර සිල්වාගේ 58 වැනි සේනාංකය මන්නාරම සටන් පෙරමුණ ඔස්සේ ද වන්නි ප්‍රදේශය මුදාගැනීම සඳහා ඉදිරියට යමින් සිටිති.

මුලතිව් ප්‍රදේශය මුදාගැනීම වන්නි සටනේ ප්‍රධානතම සහ වැදගත්ම ඉලක්කය වී ඇත. ඒ සඳහා ප්‍රබල ප්‍රහාරක සේනාංකයක් වන බ්‍රිගේඩියර් නන්දන උඩවත්තගේ 59 වැනි සේනාංකය මේ වන විට වැලිඔය සටන් පෙරමුණ ඔස්සේ ඉදිරියට ඇදෙමින් සිටී. එම සේනාංකයේ හමුදා බළඇණි මේ වන විට මුලතිව් දකුණ ප්‍රදේශයේ බලය අත්පත් කරගෙන සිටිති.

"ජයසිකුරු" මෙහෙයුමේදී හමුදාවෝ වැලිඔය සිට නෙදුන්කර්නි ඔස්සේ ඉදිරියට ගොස් මාන්කුලම් මුලතිව් මාර්ගයේ ප්‍රධාන හන්දියක් වන ඔඩ්ඩුසුඩාන් දක්වා බලය අත්පත් කර ගැනීමට සමත් වූහ. "ජයසිකුරු" මෙහෙයුමේදී 55 වැනි සේනාංකාධිපති වශයෙන් කටයුතු කළ මේජර් ජෙනරාල් සරත් ෆොන්සේකා (වත්මන් යුද හමුදාපති) මෙහෙයවූ හමුදා බලසේනා විසින් මාන්කුලම් නගරය අත්පත් කර ගන්නා ලදී, එම ඉලක්කය සපුරා ගැනීම අසීරු තත්ත්වයක තිබියදී 55 වැනි සේනාංකාධිපති වශයෙන් පත් වූ මේජර් ජෙනරාල් ෆොන්සේකා මාන්කුලම් ජය ගැනීමේ සටනට නායකත්වය දී එම ඉලක්කය සපුරා ගැනීමට සමත් විය.

මාන්කුලම් සහ ඔඩ්ඩුසුඩාන් දක්වා බලය අත්පත් කරගත් "ජයසිකුරු" මෙහෙයුම තුළින් ලබාගත් ජයග්‍රහණ පසු කලෙක "පරාජය සිකුරු" බවට පත්කිරීමට එවක එම ප්‍රදේශ පාලනය කළ හමුදා ප්‍රධානීහු ක්‍රියා කළහ.

එල්. ටී. ටී. ඊ. ප්‍රහාර හමුවේ එම ප්‍රදේශවල සිටි යුද, නාවික සහ ගුවන් හමුදාවෝ වවුනියාව දක්වා පසුබැස පළා ආවේ ලැජ්ජාසහගත අන්දමිනි. එම පසුබැසීමට සහ පරාජයට වගකිවයුතු බවට චෝදනා එල්ල වූ හමුදා ප්‍රධානීන් කීපදෙනකු හමුදා සේවයෙන් නෙරපා දැමීමට එවක පැවැති රජය පියවර ගනු ලැබීය.

ඒ අනුව මේජර් ජෙනරාල් වසන්ත පෙරේරා (ගැමුණු රෙජිමේන්තුව), මේජර් ජෙනරාල් ගාමිණී ගුණසේකර (ගජබා රෙජිමේන්තුව), බ්‍රිගේඩියර් තුවාන් බෝරාන් (ඉංජිනේරු රෙජිමේන්තුව) යන හමුදා ප්‍රධානීන්ට ගෙදර යෑමට සිදුවිය. එදා එසේ මාන්කුලම් සහ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශ අතහැර පසුබැස පළා එමට ක්‍රියා නොකළා නම් අද වන විට වන්නිය ආක්‍රමණය කිරීමට ඉදිරියට ඇදෙමින් සිටින හමුදා සේනාංකවලට එම ප්‍රදේශවල සිට මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම පහසු වනු ඇත.

නමුත් අද වවුනියාව සහ වැලිඔය ප්‍රදේශවල සිට ඉදිරියට ගොස් එදා අහිමිව ගිය ප්‍රදේශ නැවත අත්පත් කර ගැනීමේ දුෂ්කර කාර්යය ද හමුදාවට පැවරී ඇත. එහෙත් මෙවර එදා මෙන් A: 9 මාර්ගය ඔස්සේ මෙහෙයුම ක්‍රියාත්මක නොකෙරේ.A: 9 මාර්ගය දෙපසින් හමුදා සේනාංක 03 ක් සටන් පෙරමුණු 03 ක් ඔස්සේ මෙහෙයුමෙහි නිරතව සිටිති.

ඒ අනුව A: 9 මාර්ගයට නැගෙනහිර දෙසින් වැලිඔය සටන් පෙරමුණ ඔස්සේ 59 වැනි සේනාංකය මෙහෙයුම සිදුකරගෙන යයි. A: 9 මාර්ගයට බටහිර දෙසින් සේනාංක 02 ක් කොටින්ට එරෙහිව සටන් කරති. වවුනියාව සටන් පෙරමුණේ සිට 57 වැනි සේනාංකය ද මන්නාරම සටන් පෙරමුණේ සිට 58 වැනි සේනාංකය ද මෙහෙයුම් සිදුකරති. යාපනය අර්ධද්වීපයේ මුහමලෙයි, කිලාලි, නගර්කෝවිල් ප්‍රදේශවල සිට තවත් ප්‍රහාරක සේනාංක 02 ක් වන්නිය මුදාගැනීමේ මෙහෙයුම් සිදුකරගෙන යන අතර 53 සහ 55 එම සේනාංක වෙති. සමන්ත සූරියබණ්ඩාර සහ කමල් ගුණරත්න යන බ්‍රිගේඩියර්වරු එම සේනාංක මෙහෙයවති.

වත්මන් යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා හමුදාපති තනතුරට පත්වන විට යුද හමුදාව සතුව පැවැතියේ අතිරේක සේනාංක 01 ක් පමණි. ඒ 53 වැනි සේනාංකයයි. දැන් එම සංඛ්‍යාව 05 ක් දක්වා වැඩි වී ඇත. 53,55,57,58 සහ 59 යන එම අතිරේක සේනාංක 05 මේ වන විට කොටි ත්‍රස්තවාදීන්ට එරෙහිව සටන් වදින ප්‍රහාරක සේනාංක වශයෙන් වන්නි ප්‍රදේශය මුදාගැනීමේ මෙහෙයුම්වල සාර්ථකව නිරතව සිටිති.

Courtesy: 2008/02/15 www.divaina.com